තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## එස්.ඒ.එස්. උපේන්ද්‍ර ඇතුළු පිරිස එ. ලංකා විදුලිබල මණ්ඩලය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/1274/2019 (2019.10.07) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ:ජනරාල්-** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** - එස්.ඒ.එස්. උපේන්ද්‍ර ඇතුළු පිරිස
**නොතිසි ලත් පාර්ශවය**- නම් කළ නිලධාරී, ලංකා විදුලිබල මණ්ඩලය

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.01.21 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | 2019.02.07 |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.02.07 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.02.21 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:
අභියාචක විසින් 2019.01.21 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

ලංවිම විදුලි ඉංජිනේරු II පන්තිය II ශ්‍රේණිය බඳවා ගැනීමේ දෙවන සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම්ලත් පිරිසගේ නාම ලේඛනය

තොරතුරු නිලධාරියා 2019.02.07 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ විදුලි ඉංජිනේරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය තවමත් අවසන් වී නොමැති බැවින් දැනට ඒ පිළිබඳව තොරතුරු ලබා දීමේ හැකියාවක් නොමැති බවයි. විදුලි ඉංජිනේරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය තවමත් අවසන් වී නොමැති බැවින් දැනට ඒ පිළිබඳව තොරතුරු ලබා දීමේ හැකියාවක් නොමැති බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2019.02.07 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019.02.21 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය පැමිණ නොමැති බැවින් අභියාචනය කල් තබන ලදී.
**නියෝගය:**

අභියාචනය 2019.03.16 දිනට කල් තබන ලදී.

කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*******************************************

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1274/2019 (2020.06.02) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ:ජනරාල්-** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

රට තුළ COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා, මුල් වාරයේ, ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. **ඒ අනුව මෙම අභියාචනය සඳහා, ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරනු ලැබේ.** ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමකට ලක් විය හැකියි.

අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ලබා දිය හැකි තොරතුරු බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

**නියෝගය:**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය සතුව පවතින හෙයින්, , එම ඉල්ලීමට අදාළ තොරතුරු ලබා දීමට නියෝග කරනු ලැබේ. අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.